# කාර්යසාධන වාර්තාව

# 2015

## රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

# දැක්ම

**ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සහතික කරනු**

**ලබන ප්‍රධානතම ආයතනය බවට පත්වීම**

# මෙහෙවර

**රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය උපරිමත්වයට පත් කිරීම**

**සඳහා, විශිෂ්ඨ පරිචයන් භාවිතා කරමින් යහපත්**

**අභිලාෂයන් සුරක්ෂිත කරනු පිණිස රාජ්‍ය ව්‍යාපාරවල**

**යහපාලනය ශක්තිමත් කිරීම**

# පටුන


රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ........ 1

1. සමාලෝචනය ........ 1

2. 2015 කාලපරිච්ඡේදය තුල රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉටු කල ප්‍රධාන කාර්යයන් ........ 1

3. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත් වන රාජ්‍ය ව්‍යවසායන්හි භෞතික කාර්යයසාධනය 5

3.1 මහා භාණ්ඩාගාරයට ගෙවන අයභාර හා ලාභාංශ ........ 5

3.2 රාජ්‍ය ව්‍යවසායන්හි සේවා නියුක්තිය ........ 5

3.3 රාජ්‍ය ව්‍යවසායන් සඳහා අයවැය ප්‍රතිපාදන ........ 5

3.4 ක්‍රමෝපායික වශයෙන් වැදගත්වන රාජ්‍ය වාණිජ ව්‍යවසායන්හි මූල්‍ය තත්ත්වය ........ 6

4. රාජ්‍ය වාණිජ ව්‍යවසායයන්හි කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ දායකත්වය ........ 6

4.1 රාජ්‍ය වාණිජ ව්‍යවසායයන්ගේ කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග හා නිර්දේශයන් .. 6

5. මානව සම්පත් කළමනාකරණය ........ 23

5.1 මාණ්ඩලික නිලධාරීන්ගේ තොරතුරු 2015 ........ 23

5.2 2015 වසරේ ස්ථාන මාරුවීම් ........ 24

5.3 සේවක සංයුතිය - 2015 ........ 24

5.4 කාර්යය මණ්ඩල පුහුණුවීම් - 2015 ........ 25

6. මූල්‍ය කළමනාකරණය ........ 26

6.1 2015 හා 2014 වර්ෂ සඳහා අයවැයගත ප්‍රතිපාදන සහ තථ්‍ය වියදම ........ 26

6.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම - 2015 ........ 26

ඇමුණුම I: රාජ්‍ය ව්‍යවසායන්හි වාර්ෂික වාර්තා භාරදීම ........ 27

ඇමුණුම II : රාජ්‍ය වාණිජ ව්‍යවසායන්ගෙන් ලද අයභාර / ලාභාංශ ආදායම ........ 29

ඇමුණුම III: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත් රාජ්‍ය ව්‍යවසායයන් සඳහා අයවැය ප්‍රතිපාදන ලබා දීම ........ 30

ඇමුණුම IV: 2015.12.31 දිනට රාජ්‍ය ව්‍යවසායන් 55 හි මූල්‍ය තත්ත්වය ........ 31

## රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය

### 1. සමාලෝචනය

රජය සතු ව්‍යවසායයන්හි කාර්ය සාධනය නිරීක්ෂණය සඳහාත්, 1971 අංක 38 දරණ මුදල් පනතේ දෙවන කොටසේ විධිවිධාන පරිදි රාජ්‍ය සංස්ථාවන්හි මූල්‍ය පාලනය හා කටයුතු පරිපාලනය කිරීමටත්, ඒකාබද්ධ/සංස්ථාපිත යහපාලනය මඟින් රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යසාධනය වැඩිදියුණු කර ගැනීමටත් 2002 වසරේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව නැවත පිහිටුවන ලදී. දැනට ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායයන් 245 ක් පමණ ඇති අතර ඉන් 127 ක් පමණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත් වන අතර, රාජ්‍ය අයවැය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක ඉතිරි ආයතන 118 ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත් වන රාජ්‍ය ව්‍යවසායන්ගෙන් වාණිජ ක්‍රියාකාරකම්හි නිරත වන ආයතන 55 ක් උපාය මාර්ගික රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් ලෙස හඳුනාගෙන ඇත. එම රාජ්‍ය වාණිජ ව්‍යවසායන්ගේ මුළු වත්කම් ප්‍රමාණය 2014 දී රු. බිලියන 5,603 සිට 2015 දෙසැම්බර් 31 වන විට රු. බිලියන 6,165 ක් දක්වා සියයට 10 කින් වර්ධනය කර ගෙන ඇත. මෙම රාජ්‍ය වාණිජ ව්‍යවසායන් 55 සතු සම්පූර්ණ වත්කම් පදනමින් සියයට 89.6 ක් එනම් බිලියන 5,525 ක්, උපාය මාර්ගික වශයෙන් වැදගත් ප්‍රධාන රාජ්‍ය වාණිජ ව්‍යාපාර 10 වන ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම, ශ්‍රී ලංකා එයාර්ලයින් සමාගම, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය, ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතු වේ.

### 2. 2015 කාලපරිච්ඡේදය තුල රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉටු කල ප්‍රධාන කාර්යයන්

#### අ) චක්‍රලේඛ නිකුත් කිරීම සහ මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා සංශෝධන

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව අඛණ්ඩව රාජ්‍ය ව්‍යවසායයන්හි මෙහෙයුම් හා මූල්‍ය කළමනාකරණයට අදාලව චක්‍රලේඛ/මාර්ගෝපදේශ සංවර්ධනය කිරීමේ හා නිකුත් කිරීමේ කටයුතු වල නිරත විය. 2015 වසර තුලදී සන්නිවේදන පහසුකම් සැපයීම, ප්‍රවාහන පහසුකම් සැපයීම හා අධ්‍යක්ෂ මණ්ඩල සඳහා දීමනා ගෙවීම් ආදියට අදාලව

චක්‍රලේඛ 3 ක් නිකුත් කිරීම මඟින් ආයතනය විසින් රජය සතු ව්‍යාපාර වල යහපාලනය හා මූල්‍ය විනයක් ඇති කිරීමට කටයුතු කොට ඇත.

**ආ) පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභා (කෝප්) රැස්වීම් සඳහා සහය ලබා දීම**

2015 ජනවාරි මස පැවති මහ මැතිවරණයෙන් පසුව 2015 වර්ෂය තුලදී නව පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභාවක් පත් නොකළ බැවින් එම වර්ෂය තුලදී පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභාව ක්‍රියාත්මක නොවීය. එසේවුවත්, රාජ්‍ය ව්‍යවසායන් සඳහා 2014 වසරේදී කෝප් කමිටුව විසින් දෙන ලද උපදෙස් හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසු විපරම් කිරීමට කටයුතු කරන ලදී. දෙපාර්තමේන්තුව විසින් රජය සතු ව්‍යවසායන්හි වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව නිරීක්ෂණය කරන ලද අතර ඊට අදාල තොරතුරු ඇමුණුම I හි දක්වා ඇත.

ඇ) රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති විසින් සකස් කළ වාර්තාවන්හි විගණන නිරීක්ෂණ පිළිබඳ පසු විවරණයන් සිදු කරන ලදී.

ඈ) රාජ්‍ය ව්‍යවසායන්හි වාර්ෂික සමුළු/කොටස් හිමියන්ගේ රැස්වීම්, විශේෂ සභාවාර සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින් සහභාගි වූ අතර රජයේ ප්‍රතිපත්ති අනුව යමින් එම ව්‍යාපාරයන්හි කාර්යයසාධනය වැඩිදියුණු කර ගැනීම සඳහා කළමණාකාරීත්වය වෙත මාර්ගෝපදේශකත්වය ලබා දෙන ලදී.

ඉ) සියලුම රාජ්‍ය ව්‍යවසායයන්ගේ යහපාලනය පවත්වාගෙන යාමේ අරමුණින් සමාගම් පනතට යටත් වන රාජ්‍ය සමාගම් සඳහා විගණකාධිපතිගේ නිර්දේශ සහිතව පෞද්ගලික විගණකවරු පත් කිරීම සිදු කරනු ලබයි. 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව සියළුම රාජ්‍ය ව්‍යවසායන් විගණනය කිරීම විගණකාධිපති සතු වන අතර එය 2016 වසරේ සිට ක්‍රියාත්මක වනු ඇත. ඒ අනුව 2015 වර්ෂය තුලදී විගණකාධිපතිගේ නිර්දේශ සහිතව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් පත් කරන ලද පෞද්ගලික විගණන ආයතන මඟින් ආයතන වල විගණන කටයුතු සිදු කරන ලදී.

ඊ) මූල්‍ය පනත, මූල්‍ය රෙගුලාසි හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයන්ට අනුකූලව රාජ්‍ය ව්‍යවසායයන්හි මෙහෙයුම් හා ක්‍රියාකාරකම් වලට අදාලව මුදල් අමාත්‍යාංශයෙන් ලබා ගත යුතු නිර්දේශ ලබා ගැනීම පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු අවශ්‍යතාවය පරිදි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. තවද, රාජ්‍ය ව්‍යාපාර

දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ව්‍යවසායන් මඟින් සිදු කරනු ලබන විවිධ ඉල්ලීම් විශ්ලේෂණයෙන් අනතුරුව රජයේ ප්‍රතිපත්තීන්ට ඇති අනුකූලතාවය සැලකිල්ලට ගෙන මුදල් අමාත්‍යාංශය වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී. මේ යටතේ ප්‍රාග්ධන වියදම්, ණය සීමා වැඩි කර ගැනීම්, තීරු බදු සංශෝධන ආදීන් සඳහා අනුමැතිය ලබාදීම් ඇතුලත් වේ.

**උ)** රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සඳහා මුදල් අමාත්‍යාංශය විසින් නිකුත්කර ඇති මාර්ගෝපදේශ හා චක්‍රලේඛ මඟින් ලබා දී ඇති අධිකාරී බලය උපයෝගී කර ගනිමින් රාජ්‍ය ව්‍යවසායයන් සඳහා වාහන මිලදී ගැනීම්, විදේශ සංචාර, අයවැය ප්‍රතිපාදන හා මුදල් නිදහස් කිරීම් යනාදිය සඳහා අනුමැතීන් ලබා දෙන ලදී.

**ඌ)** රාජ්‍ය ව්‍යවසායයන් සම්බන්ධයෙන් බලපවත්නා මාර්ගෝපදේශ හා නීති ප්‍රතිපාදන පිලිබඳ පැහැදිලි කිරීම් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අවශ්‍යතාවය පරිදි රාජ්‍ය ව්‍යවසායයන් වෙත ලබා දෙන ලදී.

**එ)** පනත් හා ආඥා පනත් සංශෝධන සඳහා නිරීක්ෂණ හා සාකච්ඡා සිදු කිරීමට පහසුකම් සලසා දෙන ලදී.

**ඒ)** රාජ්‍ය ව්‍යවසායයන්හි ප්‍රගති සමාලෝචන, කාර්ය සාධනය හා මෙහෙයුම් ගැටළු විසඳීමට අදාල සාකච්ඡා සඳහා ඒවායේ අධ්‍යක්ෂ මණ්ඩල/ඉහල කළමනාකාරිත්වය සමඟ මුදල් අමාත්‍යතුමා, භාණ්ඩාගාර ලේකම්තුමා, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරු හා/හෝ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වීම් ගණනාවක් සංවිධානය කරන ලදී.

**ඔ)** රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් වන රජය සතු ව්‍යවසායයන් සම්බන්ධයෙන් ඉදිරිපත් වන අමාත්‍ය මණ්ඩල සංදේශ අධ්‍යයනය හා විශ්ලේෂණ සිදු කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත නිරීක්ෂණ ඉදිරිපත් කිරීම් කරන ලද අතර ඒ පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

වගුව 1: අමාත්‍ය මණ්ඩලය වෙත ලබා දුන් නිරීක්ෂණ - අංශගත විශ්ලේෂණය

| අංශය | අමාත්‍ය මණ්ඩලය වෙත ලබා දුන් නිරීක්ෂණ ප්‍රමාණය |
|---|---|
| බලශක්තිය | 17 |
| වරාය | 22 |
| ගුවන් සේවා | 7 |
| ජල සම්පාදන | 8 |
| මගී ප්‍රවාහන | 11 |
| ඉදි කිරීම් | 5 |
| පශු සම්පත් | 5 |
| වැවිලි | 8 |
| පුනර්ජනනීය නොවන සම්පත් | 3 |
| සෞඛ්‍ය | 3 |
| මාධ්‍ය | 9 |
| වෙළෙඳපොළ හා බෙදාහැරීම් | 7 |
| ප්‍රතිව්‍යුහගතකරණය | 15 |
| ධීවර | 4 |
| බැංකු | 2 |
| වාණිජ නොවන | 2 |
| එකතුව | **128** |

**ඕ)** සාමූහික ගිවිසුම් පිළිබඳ සාකච්ඡා සඳහා පත් කළ කමිටුව වෙත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් මාර්ගෝපදේශකත්වය සපයන ලදී.

**ක)** රාජ්‍ය ව්‍යවසායයන් විසින් ලබා දිය යුතු බදු හා ලාභාංශ මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රැස් කරන ලද අතර 2015 වසර සඳහා ආදායම් ගිණුම් 02 ක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී.

**ග)** රාජ්‍ය ආයෝජන ගිණුම සංසන්දනය කිරීමේ කටයුතු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2014 වසරේදී ආරම්භ කළ අතර ඊට අදාල තොරතුරු රාජ්‍ය ව්‍යවසායන්ගෙන් හා ඒවායේ උප සමාගම් වලින් රැස් කරමින් පවතී.

## 3. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත් වන රාජ්‍ය ව්‍යවසායන්හි භෞතික කාර්යයසාධනය

### 3.1 මහා භාණ්ඩාගාරයට ගෙවන අයභාර හා ලාභාංශ

රාජ්‍ය ව්‍යාපාරයන්ගෙන් ආදායම් අය කර ගැනීමේ රජයේ ප්‍රතිපත්ති අනුව සෑම රාජ්‍ය වාණිජ ව්‍යවසායයක් විසින්ම ඔවුන්ගේ ලාභයෙන් අවම වශයෙන් සියයට 30 ක් හෝ හිමිකම් ප්‍රාග්ධනයෙන් සියයයට 15 ක් වාර්ෂිකව මහා භාණ්ඩාගාරයට ලබා දිය යුතුය. 2015 වසරේ රාජ්‍ය වාණිජ ව්‍යාපාර 62 න් 45 ක් පමණ රජයට බදු නොවන ආදායම් ලෙස එනම් අයභාර හෝ ලාභාංශ ලෙස රුපියල් බිලියන 29.8 ක් ලබා දී ඇත. එය 2014 වසර සමඟ සංසන්දනයේදී සියයට 36 ක අඩු වීමකි. බදු නොවන ආදායම් අඩු වුවත් රාජ්‍ය බැංකු, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව යන ආයතනයන් ඒකාබද්ධ අරමුදලට ප්‍රධාන දායකත්වයක් ලබාදී ඇතත් විශාලතම රාජ්‍යය සතු වාණිජ ව්‍යාපාර වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලි බල මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය දායකත්වයක් ලබා දී නොමැත. ඒ අනුව 2015 වර්ෂය තුලදී රාජ්‍ය බැංකු සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පිළිවෙලින් සියයට 38 ක් හා 33 ක් වශයෙන් ලාභාංශ හා අයභාර වශයෙන් මහා භාණ්ඩාගාරයට ලබා දී ඇත. 2015 වර්ෂයේදී රජය වෙත ලාභාංශ හා අයභාර ලැබීම පිළිබඳ තොරතුරු අංක II ඇමුණුමෙහි දක්වා ඇත.

### 3.2 රාජ්‍ය ව්‍යවසායන්හි සේවා නියුක්තිය

2015 වසරේදී රජය සතු 257 ක් වන ව්‍යවසායන්හි 237,811 කින් පමණ සමන්විත වු ශ්‍රම බලකාය සිය ශ්‍රමය ලබා දුන් අතර එය 2014 වසර සමඟ සංසන්දනයේදී සුළු වශයෙන් (සියයට 0.8 කින් ) වැඩි වී ඇත.

### 3.3 රාජ්‍ය ව්‍යවසායන් සඳහා අයවැය ප්‍රතිපාදන

ආයෝජන ලෙස රු. බිලියන 94 ක් පමණ රාජ්‍ය අයවැය මඟින් රාජ්‍ය ව්‍යාපාර වෙත ලබා දී ඇත. 2015 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය විසින් රජය සතු ව්‍යවසායයන් 08 ක් සඳහා රු. බිලියන 19 ක් එම ආයතනයන්හි ප්‍රතිව්‍යුහගතකරණය ව්‍යාපාර වැඩි දියුණු කිරීම, වැටුප් ගෙවීම් හා තාක්ෂණ දැනුම ලබා ගැනීම උදෙසා ලබා දී ඇත. 2014 වසරේදී රාජ්‍ය ව්‍යාපාර 30 ක් සඳහා රු. බිලියන 126 ක් ලබා දී ඇති අතර 2015 දී ආයතන 12 ක් සඳහා රු. බිලියන 95 ක් ලබා දී ඇත. රාජ්‍ය ව්‍යවසායන්හි ප්‍රදාන ප්‍රාග්ධන අඩුවීම හේතුවෙන් ගිය වසරට

සාපේක්ෂව සියයට 24 කින් පමණ රජයේ වැය අඩු කොට ඇත. රාජ්‍ය ව්‍යවසායයන් සඳහා ලබා දුන් අයවැය ප්‍රතිපාදන ඇමුණුම III හි දක්වා ඇත.

### 3.4 ක්‍රමෝපායික වශයෙන් වැදගත්වන රාජ්‍ය වාණිජ ව්‍යවසායන්හි මූල්‍ය තත්ත්වය

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් කලින් කලට රාජ්‍ය ව්‍යවසායයන්හි මූල්‍ය තොරතුරු එක්රැස් කර විශ්ලේෂණය කරන අතර එහි ප්‍රතිඵල අනුව අධ්‍යක්ෂ මණ්ඩල හා කළමනාකාරිත්වය සමඟ සමාලෝචන සාකච්ඡා පැවැත්වේ. ක්‍රමෝපායික වශයෙන් වැදගත් වන රජය සතු වාණිජ ව්‍යවසායයන්හි මූල්‍ය තත්ත්වය ඇමුණුම IV හි දක්වා ඇත.

## 4. රාජ්‍ය වාණිජ ව්‍යවසායයන්හි කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ දායකත්වය

### 4.1 රාජ්‍ය වාණිජ ව්‍යවසායයන්ගේ කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග හා නිර්දේශයන්

රාජ්‍ය වාණිජ ව්‍යවසායන්හි කෙටිකාලීන හා මධ්‍ය කාලීන අරමුණු ලඟා කර ගැනීම සහතික කිරීම සඳහා පහත දැක්වෙන නිර්දේශ ඉදිරිපත් කර ඇත.

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග | නිර්දේශයන් |
|---|---|---|
| **බලශක්ති අංශය**<br><br>ලංකා විදුලිබල මණ්ඩලය | ලංකා විදුලිබල මණ්ඩලය එහි මූල්‍ය කාර්යසාධනය ඉහළ නංවමින් 2015 වර්ෂය සඳහා රු. බිලියන 20.7 ක පමණ මෙහෙයුම් ලාභයක් වාර්තා කර ඇත.<br><br>ඉන්ධන විදුලි උත්පාදනය ගල් අඟුරු විදුලි උත්පාදනයට ආදේශනය වීම මගින් ලංකා විදුලිබල මණ්ඩලයට එහි මූල්‍ය තත්වය කළමනාකරණය කිරීමට හැකි වූ අතර බල ශක්ති උත්පාදන මිශ්‍රයට ගල් අඟුරු උත්පාදනය ගිගා වොට් පැය 4457 ක් එකතු වීම සමඟ ජලවිදුලිය කෙරෙහි රඳා පැවැත්ම යම් ප්‍රමාණයකට ලිහිල් වීම කර ගැනීමටද හැකි විය.<br><br>2015 වර්ෂයේ පැවති වැසි සහිත කාලගුණික තත්ත්වය මෙන්ම ගල් අඟුරු විදුලි උත්පාදනය වැඩි වීම හේතු කොට ගෙන 2014 වසරේ ජල | ඒක පුද්ගල ආදායම ඉහළ යාම හේතුවෙන් විදුලි උපකරණ භාවිතයෙහි වැඩි වීමත්, විදුලි මොටර් රථ භාවිතය වැඩි වීමද හේතු කොටගෙන විදුලිබල ඉල්ලුම සහ භාවිතය වැඩිවීම පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලයේ මැදිහත් වීම වඩාත් අවශ්‍ය වී ඇත.<br><br>මේ සමඟම, 2020 වන විට රටේ විදුලිබල උත්පාදන ධාරිතාවයෙන් අවම වශයෙන් සියයට 20 ක ප්‍රමාණයක් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් ලබා ගැනීම කෙරෙහි රටේ බලශක්ති ප්‍රතිපත්තියට අන්තර්ගත වීම අවශ්‍ය වේ. ඒ අනුව මෙම අරමුණු කරා ළඟා වීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් නව්‍ය මූල්‍ය සහ වඩාත් යෝග්‍ය මෙහෙයුම් ආකෘති අනුගමනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. |

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග | නිර්දේශයන් | නිර්දෙ |
|---|---|---|---|
| | විදුලිය: තාප විදුලිය (ඉන්ධන): තාප විදුලිය (ගල් අඟුරු) අනුපාතය 39:35:26 සිට 2015 වසරේ දී 45:21:34 දක්වා බලශක්ති උත්පාදන සංයුතිය වෙනස් වීමේ ප්‍රතිඵලයක් ලෙස 2014 දී රු. 20.15 ක් වූ ඒකකයක පිරිවැය 2015 දී රු. 14.85 දක්වා අඩු වී ඇත.<br><br>විදුලි බෙදාහැරීම් හා විදුලි සම්ප්‍රේෂණ පද්ධතියට කරන ලද ප්‍රමාණාත්මක ආයෝජන මඟින් 2007 වසරේ පැවති සියයට 17 ක් වූ පද්ධති හානි 2015 වසරේ දී සියයට 10 ක් දක්වා අඩු කර ගැනීමට හැකි විය.<br><br>2014-2015 වසර වලදී රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් මත විදුලිබල මණ්ඩලයට ලබා දී තිබූ රු. බිලියන 173 ක පමණ ණය, ප්‍රාග්ධනය බවට පත් කිරීම හේතුවෙන් එහි ප්‍රාග්ධන ව්‍යුහය ප්‍රමාණාත්මක ලෙස වැඩි විය. | 2016-2020 කාලය තුල සිය මෙහෙයුම් කටයුතු ඉහළ නැංවීම සහ පුළුල් කිරීම සඳහා ප්‍රතිආයෝජනය ලෙස වසරකට අවශ්‍ය වන රු. බිලියන 15 ක පමණ වූ අරමුදල් සම්පාදනය කර ගැනීම ලංකා විදුලිබල මණ්ඩලයට වඩා අභියෝගාත්මක වේ. ඒ අනුව ලංකා විදුලිබල මණ්ඩලය විසින් සිය වත්කම් පදනම නඩත්තු කිරීම, ව්‍යාප්ත කිරීම හා ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා වන මූල්‍ය අවශ්‍යතා ප්‍රාග්ධන වෙළඳපොළ අනුසාරයෙන් සම්පාදනය කර ගැනීම සඳහා සක්‍රීයව ඉදිරි පියවර ගත යුතුය. | |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මේ වන විට වෙළෙඳපොළ තුළ සියයට 85 කට ආසන්න කොටස් භාගයක් හිමි කර ගනිමින් ඛනිජ තෙල් අංශයේ ප්‍රධාන කොටස්කරු බවට පත්ව ඇති අතර ලිහිසි තෙල් කර්මාන්තයේ තෙවන විශාලතම කොටස්කරුවා බවට පත්ව ඇත. 2015 වසරේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රටෙහි මුළු ආනයන වටිනාකම වන ඇ.ඩො. මිලියන 18,935 ක ප්‍රමාණයෙන් ඇ.ඩො මිලියන 1,867 ක ප්‍රතිශතයකට දායක වී ඇති අතර රජයේ බදු ආදායමටද සියයට 10 ක දායකත්වයක් ලබා දී ඇත.<br><br>මෑත කාලීනව, ජාත්‍යන්තර වෙළෙඳපොළේ ඛනිජ තෙල් මිල ගණන් වල පහළ බැසීම හේතුවෙන් 2014 වසරේ ඇ.ඩො 75.98 ක් වූ බොර තෙල් බැරලයක සාමාන්‍ය ආනයනික මිල 2015 වසර වන විට ඇ.ඩො 41.21 දක්වා පහළ බසින ලදී. 2015 වසරේ ඛනිජ තෙල් ආශ්‍රිත නිමි නිෂ්පාදන බැරලයක ජාත්‍යන්තර වෙළෙඳපොළ | රජයන් අතර ඇතිකර ගන්නා කාලීන ගිවිසුම් නොමැතිවීම, සැපයුම් සුරක්ෂිතතාව සහ සැලසුම් නොකළ පිරිපහදු බිඳ වැටීම් කෙරෙහි බලපෑ හැක. එබැවින් රජයන් අතර ඇති කර ගන්නා ගිවිසුම් මගින් මර්බන් බොරතෙල් මිලදී ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා රජය විසින් පියවර ගෙන ඇත.<br><br>ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගමේ කොළොන්නාව සහ මුතුරාජවෙල පර්යන්තවල පවතින සීමිත ගබඩා පහසුකම්, පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කර තබා ගැනීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් මිල පහළ යන අවස්ථාවලදී වාසිදායක වන අයුරින් රට තුළ ගබඩා කළ හැකි තෙල් තොගය සීමා කිරීමට සිදු වී ඇත. ඒ අනුව රජය විසින් 2016 අයවැය යෝජනාවලිය මඟින් ත්‍රිකුණාමලය තෙල් ටැංකි ගබඩාව නැවත ප්‍රයෝජනයට ගැනීමට ඇති හැකියාවද සොයා බැලීමට යෝජනා කර ඇත. | |

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග | නිර්දේශයන් | නිර්දේ |
| --- | --- | --- | --- |
| | සාමාන්‍ය මිල ඇ.ඩො 65 ක් පමණ විය. ඒ අනුව ඛනිජ තෙල් නිෂ්පාදනවල, ජාත්‍යන්තර වෙළෙඳපොළ මිල ගණන්වල පහළ බැසීමේ වාසිය පාරිභෝගිකයන් වෙත ලබා දීම සඳහා රජය විසින් 2015.01.22 දින ඒවායේ දේශීය වෙළෙඳපොළ මිල ගණන් විශාල ලෙස පහත හෙළනු ලැබිය.<br><br>ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2015 වසරේ මෙහෙයුම් ලාභය රු. බිලියන 27.6 ක් වූ අතර එය 2014 වසරේ ලැබූ රු. බිලියන 12.4 හා සසඳා බැලීමේදී සියයට 122 ක වර්ධනයකි. කෙසේවුවද, මෙම මෙහෙයුම් ලාභය 2014 වසරේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලැබූ රු. බිලියන 1.6 ක සමස්ත ලාභයට සාපේක්ෂව 2015 වසර අවසානය වන විට රු. බිලියන 18.4 ක සමස්ත අලාභයක් බවට පරිවර්තනය විය. 2015 වසර තුළ රුපියලේ අගය සියයට 9.3 කින් පමණ බැසීම නිසා සිදුවූ විනිමය අලාභය සහ අති විශාල බැංකු ණය ප්‍රමාණය හේතුවෙන් ඇති වූ ඉහළ මූල්‍ය පිරිවැය යන කරුණු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත අලාභ තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මුළු අලාභය කෙරෙහි ප්‍රවාහන අංශය සියයට 69 කින් සහ දේශීයව පිරිපහදු කරන ලද පහළ මට්ටමේ ඛනිජ තෙල් නිෂ්පාදන අපනයනය කිරීම් සියයට 20 කින් දායක වී ඇති අතර පිරිවැයට වඩා අඩු මිලකට භූමි තෙල් විකිණීම හේතුවෙන් ගෘහස්ත අංශය සියයට 11 ක ප්‍රතිශතයකින් මුළු අලාභයට දායක වී ඇත.<br><br>කෙසේවුවද, විදුලිබල උත්පාදනය සඳහා යොදා ගන්නා දැවි තෙල් හා අනෙකුත් ඉන්ධන යම් ආන්තිකයක් සහිතව විකිණීම හේතුවන් පසුගිය වසර වලදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අලාභය කෙරෙහි විශාල බලපෑමක් ඇති කළ විදුලිබල උත්පාදන අංශය 2015 වසරේදී ලාභදායී තත්ත්වයක් කරා පරිවර්තනය වීම කැපී පෙනෙන ලක්ෂණයකි. | වරායේ සිට ගබඩා වෙත තෙල් ප්‍රවාහනය කිරීම සඳහා රට හරහා එළා ඇති තෙල් නළ පද්ධතිය යල් පැන ගොස් ඇත. එබැවින් නල වල<br><br>පවත්නා අවපීඩන තත්ත්වය යටතේ තෙල් තොග නිසි පරිදි මුදා හැරීම සඳහා කල් ගත වීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නැව් පමා කුලිය ඉහළ යාමට හේතු වී ඇත. මෙම ඉහළ යන පිරිවැය තත්ත්වය යටතේ වෙනත් වියදම් අවම කිරීම සඳහා උසස් තාක්ෂණයෙන් යුතු නව තෙල් නල එළීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමටද රජය සැලසුම් කර තිබේ. | |

| අංශය | රාජ්‍ය ව්‍යවසායයන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග | නිර්දේශයන් | නිර්දේ |
|---|---|---|---|
| **ජල අංශය**<br><br>ජාතික ජල සම්පාදාන හා ජලාපවහන මණ්ඩලය | 2020 වසර වන විට නල ජල සැපයුම දැනට තිබෙන මට්ටම වන සියයට 44 සිට සියයට 60 දක්වා වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට සුවිශේෂී වූ කාර්යභාරයක් ඉටුකිරීමට සිදුවී ඇත.<br><br>ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට මහා භාණ්ඩාගරය විසින් 2014.12.31 වන විට ලබා දී තිබූ රුපියල් බිලියන 39.8 ක උප ණය මුදල 2015.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ශේෂ පත්‍රය ශක්තිමත් කිරිම සඳහා රජයේ ප්‍රාග්ධනය බවට පරිවර්තනය කරන ලදී.<br><br>සමස්ථ ආදායම් නොලබන ජල ප්‍රමාණය වසර කිහිපයක් තුල සියයට 27.28 ක් දක්වා අඩු වී ඇත. එසේවුවද, තවමත් කොළඹ හා තදාසන්න ප්‍රදේශයන්හි එය තවමත් සියයට 46.16 වූ ඉහළ මට්ටමක පවතින අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩයේ මෙහෙයුම් කාර්යසාධනයට එමගින් සැලකිය යුතු බලපෑමක් ඇති කරයි.<br><br>ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මුහුණදී ඇති ද්‍රවශීලතා ගැටළු සැලකිල්ලට ගනිමින් මහා භාණ්ඩාගාරය විසින් 2015 මාර්තු මාසයේදී ජල ව්‍යාපෘති සඳහා දේශීය අධාර අරමුදල් අවශ්‍යතා වෙනුවෙන් මූල්‍ය පහසුකම් සැලසීමේ අරමුණින් රුපියල් බිලියන 13.9 ක වටිනාකමින් යුතු බැඳුම්කර නිකුත් කර ඇත.<br><br>විශේෂයෙන්ම රටෙහි නිදන්ගත වකුගඩු රෝග අවම කිරිම සඳහා සුරක්ෂිත ජල ආවරණය සියයට 100 මටට්මක් සහතික කිරීමට රජය විසින් ඉලක්කගත කර ඇත. ඒ අනුව, නිදන්ගත වකුගඩු රෝග අවම කිරිම සඳහා ගෙන එන ජල ව්‍යාපෘති වල ඉදිරි අවුරුදු පහක කාලය සඳහා ණය සියයට 100 ක්ම සේවාකරණය (වාරික සහ පොළිය) මහා භාණ්ඩාගාරය විසින් සිදු කරනු ලබයි. | දුර්වල මූල්‍ය ප්‍රවාහ උත්පාදනය නිසා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ස්වාධිනව එහි ව්‍යාපෘති ණය සේවාකරණය කිරීමට නොහැකි හෙයින් ඔවුන්ගේ මූල්‍ය තත්ත්වය වර්ධනය කර ගන්නා තෙක් මහා භාණ්ඩාගාරය විසින් අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයනු ලබයි. ඒ අනුව භාණ්ඩාගාර ඇපකර සහ ණය සේවාකරණය සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන එකහ වී ඇති පරිදි මහා භාණ්ඩාගාරය විසින් සපයනු ලබයි.<br><br>ජල ව්‍යාපෘතින්හි පවතින ජාතික වැදගත්කම සැලකිල්ට ගනිමින් 2020 වන විට සියයට 60 නල ජල අවරණය ඉලක්කය සපුරා ගැනීම සඳහා සැලසුම් කරන ලද ජල ව්‍යාපෘති නියමිත කාලය සම්පූර්ණ කිරීම කෙරෙහි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විශේෂ අවධානයක් යොමු කළ යුතුය.<br><br>කුඩා ප්‍රමාණයේ ව්‍යාපෘති සඳහා පවතින මූල්‍යන අවශ්‍යතා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයාගත යුතුය. ඒ අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ආයතනය ශ්‍රේණිගත කර තරඟකාරී අනුපාත යටතේ ණය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.<br><br>දැනට පවතින ගාස්තු අයකිරීමේ ක්‍රමවේදය මඟින් මූල්‍ය වියදම් දැරීමට ප්‍රමාණවත් මුදල් ප්‍රවාහයක් උත්පාදනය නොවන බැවින් පිරිවැය පිළිබිඹු කෙරෙන ගාස්තු අයකිරීමේ ක්‍රමවේදයක් මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ හඳුන්වා දීමට නියමිතය.<br><br>ජල ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේදී ඇති වන අනවශ්‍ය ප්‍රමාදයන් හා විෂය පථයේ වෙනස්කම්, අතිරේක වගකීම් හා අනවශ්‍ය පිරිවැය වැඩිවීම කෙරෙහි බලපාන බව නිරීක්ෂණය වේ. එමනිසා, නගර සැලසුම් හා | |

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග | නිර්දේශයන් | නිර්දේ |
|---|---|---|---|
| | | ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ හා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ සහයෝගය ඇතිව ජල ව්‍යාපෘති සඳහා සමීප අධීක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතුය. | |
| **මගී ප්‍රවාහන අංශය**<br><br>ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය<br><br>(ශ්‍රී ලංගම) | ශ්‍රී ලංගමයේ අතිරේක සේවකයින් ඉවත් කිරීම සඳහා ආකර්ෂණීය ස්වයං විශ්‍රාම වන්දි ක්‍රමයක් යෝජනා කරනු ලබන අතර එමඟින් 8,000 ක් පමණ වූ සේවකයන් පිරිසක් විශ්‍රාම ගැන්විය හැකි වේ.<br><br>හිඟ අර්ථසාධක අරමුදල් සඳහා වූ මූල්‍ය අවශ්‍යතාවය වන රුපියල් බිලියන 13.2 ක් ගෙවීමට අවශ්‍ය අරමුදල් සපයා ගැනීමට ශ්‍රී ලංගමයට අයිති අනාර්ථික අතිරේක ඉඩම් රාජ්‍ය අංශයට රජයේ සංවර්ධන ව්‍යාපෘති අවශ්‍යතාවයන් සඳහා ලබාදී එහි ඉඩම් වටිනාකම ලබාගැනීමට සැලසුම් කරමින් තිබේ.<br><br>තවද මහා භාණ්ඩාගාරය විසින් මසකට වරක් පුනරාවර්තන වියදම් සඳහා රුපියල් බිලියන 1,350 ක් ශ්‍රී ලංගමයට ලබා දීම අනුමත කරනු ලබයි. | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ ක්‍රියාවලියක් (ERP) බස් මෙහෙයුම් මට්ටම දක්වා ව්‍යාප්ත කළ යුතුය.<br><br>ධාවනය කිරීමට අපහසු තත්ත්වයේ පවතින බස් රථ අපහරණය කිරීම.<br><br>ක්‍රමවත් ආකාරයේ ව්‍යාපාර සැලැස්මක් මඟින් ශ්‍රී ලංගමය ලාභදායී ආයතනයක් බවට පත් කිරීමට ක්‍රියා කිරීම.<br><br>ඉන්ධන අකාර්යක්ෂමතාව හා කාන්දුවීම අවම වන පරිදි ක්‍රමවත් අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කිරීම. | |
| **ගුවන් සේවා අංශය** | ගුවන් සේවා කර්මාන්තය ඕනෑම රටක සංචාරක ක්ෂේත්‍රය සමග ශක්තිමත් ලෙස බැඳී ඇත. 2015 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළ ගුවන් මගීන් 8,505,740 ක් පමණ හසුරුවා ඇති අතර එය 2014 වර්ෂය හා සැසැඳීමේදී සියයට 9.3 ක වර්ධනයක් පෙන්නුම් කරයි. තවද, ජාත්‍යන්තර ගුවන් සංචලනයන් 56,292 ක් දක්වා 2015 දී සියයට 2 කින් වැඩී ඇත. | ගුවන් සේවා කර්මාන්තයේ යටිතල පහසුකම් ගුවන් සේවා, ගුවන් පරිපථ, ගුවන් තොටුපළ පහසුකම් මෙන්ම වෙනත් අදාළ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ.<br><br>සංචාරකයන් තුළ රටෙහි සන්නම් ප්‍රතිරූපය කෙරෙහි සෘජුව බලපානු ලබන කාර්යක්ෂම සඵලදායී සේවා සැපයීමක් සහතික කළ යුතුය. | |

<table>
<tr><th>අංශය</th><th>රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග</th><th>නිර්දේශයන්</th><th>නිර්දෙ</th></tr>
<tr><td>සී/ස ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම</td><td>වර්ෂයකට ගුවන් මගීන් සංචලන මිලියන 15 කට ප්‍රමාණයක් හැසිරවිය හැකි පරිදි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධන ව්‍යාපෘතියේ දෙවන අදියර සී/ස ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් සිදු කරනු ලබයි.</td><td>2016 අයවැය යෝජනාවට අනුව, භාණ්ඩ ප්‍රවාහ සමාගම් සමග ඒකාබද්ධව ඉදිරියේදී මත්තල ගුවන්තොටුපළ ගුවන් බඩු කේන්ද්‍රස්ථානයක් ලෙස භාවිතා කිරීමටත් පියාසර පාසල්, නඩත්තු, අළුත්වැඩියා සහ පූර්ණ අළුත්වැඩියා පහසුකම් ස්ථාපිත කිරීමට පෞද්ගලික අංශය දිරිමත් කිරීමටද රජය මගින් තීරණය කර ඇත.</td><td></td></tr>
<tr><td>ශ්‍රී ලංකන් ගුවන් සමාගම</td><td>ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරිමේ බැංකුව සතුව තිබූ ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ කොටස් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරමින් පහත දක්වා ඇති ආකාරයට මහා භාණ්ඩාගාරයට පවරා ගෙන ඇත.
<table>
<tr><th>බැංකුව</th><th>කොටස් ගණන</th><th>නිකුත් කර ඇති භාණ්ඩාගාර බැඳුම්කර රු.මි.</th></tr>
<tr><td>ලංකා බැංකුව</td><td>12,115,570</td><td>3,732.37</td></tr>
<tr><td>මහජන බැංකුව</td><td>4,236,135</td><td>1,305.00</td></tr>
<tr><td>ජාතික ඉතිරි කිරිමේ බැංකුව</td><td>4,236,135</td><td>1,305.00</td></tr>
<tr><td>මුළු එකතුව</td><td>20,587,840</td><td>6,342.37</td></tr>
</table>
ඒ අනුව, ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ රජය සතු හිමිකාරීත්වය සියයට 99.11 ක් දක්වා වර්ධනය වී ඇත.<br><br>2014/15 මූල්‍ය වර්ෂය තුළ රජය විසින් ශ්‍රී ලංකන් ගුවන් සමාගමට ඇ.ඩො.මිලියන 125 ක ප්‍රාග්ධන දායකත්වයක් ලබා දී ඇත.<br><br>2014/15 මූල්‍ය වර්ෂයෙහි සී/ස බණිජතෙල් සංස්ථාවට ඉන්ධන බිල්පත් ගෙවීමට සහ මෙහෙයුම් ප්‍රාග්ධන අවශ්‍යතා මත ශ්‍රී ලංකන්</td><td>මධ්‍ය කාලීන රාමුවක් තුළ ශ්‍රී ලංකන් ගුවන් සමාගමට සහ මිහින් ලංකා සමාගම් ආර්ථිකමය වශයෙන් ශක්‍යතාවක් සහිත ආයතන බවට පත් කිරීම සඳහා ව්‍යාපාරික සැලැස්මක් පිලියෙළ කිරීමට ආයතන දෙකට රජය මගින් උපදෙස් ලබා දී ඇත.ඒ අනුව 2016 දී මෙම ගුවන් සමාගම් දෙක නැවත ප්‍රතිව්‍යුහගත කරනු ඇත.<br><br>2015.12.31 වන විට ශ්‍රී ලංකන් ගුවන් සමාගම සතු සියළුම වගකීම් රජය භාර ගැනීමට තීරණය කර ඇති අතර ඉදිරියේදී පිරිසිදු ශේෂපත්‍රයන් සහිතව ව්‍යාපාරය සාර්ථකව මෙහෙයවීමට සුදුසු පාර්ශ්වකරුවන් තෝරා ගැනීමට කටයුතු කෙරේ.</td><td></td></tr>
</table>

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග | නිර්දේශයන් | නිර්දේ |
|---|---|---|---|
| | ගුවන් සමාගමට සහ මිහින් ලංකා සමාගමට රුපියල් බිලියන 15 බැගින් ණය පහසුකම් ලබා ගත හැකි වන පරිදි මහා භාණ්ඩාගාරය විසින් ලංකා බැංකුවට සහ මහජන බැංකුවට ණය පහසුකම් සැලසීමේ ලිපි දෙකක් නිකුත් කර ඇත. | | |
| මිහින් ලංකා (පුද්) සමාගම | 2014/15 මූල්‍ය වර්ෂය තුළ රජය විසින් මිහින් ලංකා සමාගමට ඇ.ඩො. මිලියන 25 ක ප්‍රාග්ධන දායකත්වයක් ලබා දී ඇත. | දූර්වල මූල්‍ය හා මෙහෙයුම් ධාරිතාව සලකා මිහින් ලංකා සමාගම "සැරසිලි නැති" අඩු වියදම් ගුවන් සේවාවක් ලෙස ස්ථාපිත කිරීමට රජය උපදෙස් ලබා දී ඇත. | |
| **වරාය අංශය**<br><br>ශ්‍රී ලංකා වරාය අධිකාරිය | මෙම වසර තුලදී හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ දෙවන අදියර සම්පූර්ණ කිරීමට වරාය අධිකාරියට හැකියාව ලැබුණු අතර එහි තෙවන අදියර සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තවදුරටත් සිදු කරනු ලබයි.<br><br>වසරේ මැද භාගය වන විට නැගෙනහිර බහාලුම් පර්යන්තයේ ඉදි කිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට වරාය අධිකාරියට හැකි විය. මේ වන විට වරාය අධිකාරිය විසින් ආසියානු සංවර්ධන බැංකුවේද සහාය ඇතිව නැගෙනහිර බහාලුම් පර්යන්තයේ මෙහෙයුම් කටයුතු උපායශීලී රාජ්‍ය හා පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා වරාය සංවර්ධන ව්‍යාපාරික වැඩසටහනක් පිළියෙල කිරීමට කටයුතු කරනු ලබයි.<br><br>රටෙහි ප්‍රමුඛතම වරාය වශයෙන් කොළඹ වරාය 2015 වසරේ මාසික නෞකා හැසිරවීමේ සාමාන්‍ය 350 ක් හා විස්සේ සම ඒකක මෙහෙයවීමේ සාමාන්‍ය 180,000 කට වැඩි වශයෙන් පවත්වාගෙන යාමට සමත් වී ඇත. | වරාය අධිකාරියේ සමස්ත ණය වගකීම් ප්‍රමාණය එහි සමස්ත වත්කම් වලින් සියයට 69 ක් පමණ නියෝජනය වන බැවින්, ක්‍රමවත් ණය ස්ථායීකරණයක් සඳහා යෝග්‍ය ණය කළමනාකරණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සුදුසුය.<br><br>විදේශ විනිමය අනුපාතය වෙනස් වීම මත ඇති කරන ලද අහිතකර බලපෑම හේතුවෙන් ඇති වූ අතිරේක පිරිවැයද ඇතුළුව දැනටමත් ලබාගෙන ඇති ණය පියවීම සඳහා ප්‍රතිපාදන අවශ්‍ය බැවින් වර්ධනය කරන ලද යටිතල පහසුකම් හා අනෙකුත් සේවා පහසුකම් මගින් ආයතනයේ ඵලදායීතාව හා මෙහෙයුම් ක්‍රියාකාරකම් වල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම හරහා වරාය අධිකාරියේ සමස්ත පිරිවැටුම ඉහළ නැංවීමට සුදුසු ක්‍රියාමාර්ගයන් ගත යුතුය. | |

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග | නිර්දේශයන් | නිර්දේ |
|---|---|---|---|
| | 2015 වර්ෂය අවසන් වන විට වරාය සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් රු. බිලියන 218 ක් දක්වා විදේශීය අරමුදල් ද රු. බිලියන 14.9 ක් දක්වා දේශීය ණය ද ලබා ගැනීම සඳහා වරාය අධිකාරිය වෙත පහසුකම් සලසා දී ඇත.<br><br>ගාලු වරාය, දකුණු වෙරළ තීරය තුළ සංචාරක කටයුතු සංවර්ධනය කිරීමේ ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස වරාය අධිකාරිය විසින් හඳුනාගෙන ඇති බැවින් ඒ සඳහා ආයෝජනය කිරීමට වරාය අධිකාරිය අපේක්ෂා කරයි.<br><br>නැවියන් සඳහා ප්‍රවීණතා සහතික නිකුත් කිරීම හා ජීව මිතික හැඳුනුම්පත සහිත අඛණ්ඩ මුදා හැරීමේ සහතික ලබාදීම සඳහා වැඩපිළිවෙලක් ද ඉදිරියේදී වරාය අධිකාරිය විසින් සකස් කිරීමට නියමිතය. | | |
| **ඉදිකිරීම් අංශය** | නියම කරන ලද කාල සීමාව තුළ වාර්තා ඉදිරිපත් කරන ලෙස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ඉංජිනේරුමය කාර්යන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව යන ආයතනයන්ට උපදෙස් දී ඇත.<br><br>රාජ්‍ය ඉංජිනේරු සංස්ථව මුහුණ පා ඇති ද්‍රවශීලතා ගැටලු හේතුවෙන් 2015 අයවැය යෝජනා මඟින් සිදු කළ වැටුප් වැඩි වීම පියවීම සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ප්‍රතිපාදන ඉල්ලුම් කරමින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම. | ඉදිකිරීම් ක්ෂේත්‍රයේ තරඟකාරීත්වයට මුහුණ දීම සඳහා මෙම ආයතනයන් පුද්ගලික අංශයේ ආයතනයන් සමඟ තරඟකාරීව නව ඉදිකිරීම් භාවිතයන් හා ක්‍රියාවලීන් සඳහා අනුගත වීම සිදු කළ යුතුය.<br><br>ආයතනයේ ධාරිතා සීමාවන්ට යටත්ව ඉදිකිරීම් කොන්ත්‍රාත්තු භාර ගැනීම.<br><br>විශාල ව්‍යාපෘති හැසිරවිය හැකි විශිෂ්ට නිපුනතාවයකින් යුතු සේවකයන් යොදවා ගැනීම.<br><br>ව්‍යාපෘති භාර ගැනීමට පෙර ඒ සඳහා වන අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම තහවුරු කර ගැනීම. | |
| **බැංකු අංශය** | 2015 වසර තුළ රාජ්‍ය බැංකු විසින් රු. මිලියන 36 ක් ලාභාංශ වශයෙන් මහා භාණ්ඩාගාරයට ගෙවා ඇත.<br><br>තවද වඩාත් හොඳ ශ්‍රේණිගත කිරීම් ලබාගැනීම සහ දේශීය හා විදේශීය වෙළඳපල සඳහා පුළුල් ප්‍රවේශයක් ලබාගැනීම සඳහා 2016 අයවැය | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශ සඳහා සේවා සැපයීමට ලංකා බැංකුව හා මහජන බැංකුව සතු කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මධ්‍යස්ථාන ප්‍රතිස්ථානගත කළ යුතුය.<br><br>කර්මාන්තයේ ප්‍රතිවාදීන් සමඟ තරඟවැදීමට තාක්ෂණික හැකියාවන් පුළුල් කිරීම. | |

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග | නිර්දේශයන් | නිර්දෙ |
|---|---|---|---|
| | මඟින් බැංකු කිහිපයක් ඒකාබද්ධ කිරීමට යෝජනා කර ඇත.<br><br>ඒ අනුව රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය මඟින් ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය අරඹා ඇත. | මහජන බැංකුව, ලංකා බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මුළු ණය අනාවරණයෙන් සියයට 43 ක ප්‍රමාණයක් රජය සතු ව්‍යවසායන් ඇතුළුව රාජ්‍ය අංශය වෙත ලබා දුන් ණය වලින් සමන්විත වේ.<br><br>ණයවල ගුණාත්මක භාවය වර්ධනය කිරීම හා ආපසු අයකර ගැනීමේ යාන්ත්‍රණය වැඩිදියුණු කිරීම.<br><br>ආර්ථිකයේ මතු වී ගෙන එන අංශ හඳුනාගැනීම හා එම අංශ වෙත ණය යොමු කිරීම.<br><br>ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව සිය මූලික බැංකු කටයුතු වලින් ආදායම් ඉපයීම වෙනුවට ආයෝජන ආදායම මත අධික ලෙස යැපෙයි. ආදායමෙන් සියයට 80ක ප්‍රතිශතයක් ආයෝජන කටයුතු මඟින් උපයන අතර එයින් සියයට 92ක ප්‍රමාණයක් රජයේ බැංකු වල ඇති ස්ථාවර තැන්පතු පොලිය නියෝජනය කරයි.<br><br>මූලික බැංකු කටයුතු සඳහා ප්‍රාග්ධන ඌණ උපයෝජනය හා දුර්වල වත්කම් කළමනාකරණයේ ප්‍රතිඵලයක් ලෙස අඩු ලාභදායීත්වයක් ඇතිවීම. | |
| **අලෙවිය හා බෙදා හැරීම**<br><br>හොටෙල් ඩිවලොපර්ස් ලංකා පුද්ගලික සමාගම | හොටෙල් ඩිවලොපර්ස් ලංකා පුද්ගලික සමාගමේ ආදායම 2013/14 වසරේ පැවති රු. මිලියන 2,858 සිට 2014/15 වසරේ රු. මිලියන 2,543 ක් දක්වා අඩු වී ඇත.<br><br>2014/15 මූල්‍ය වසර තුළ සමාගම විසින් රු.මිලියන 275 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත.<br><br>හිල්ටන් හෝටලයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ලංකා බැංකුවෙන් සහ සම්පත් බැංකුවෙන් ඇ.ඩො. මිලියන 27 ක ණය පහසුකම් ලබා ගෙන ඇත. | දෙස් විදෙස් සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා සෑම ස්ථරයකටම සරිලන පරිදි පහසු මිල පැකේජ නිර්මාණය කිරීම. | |
| | | | |

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග | නිර්දේශයන් | නිර්දේ |
|---|---|---|---|
| ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය | 2015 වසරේදී ආදායම සියයට 10 කින් අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස 2014 දී වාර්තාගත රු. මිලියන 9 හා සැසඳීමේදී බදු පෙර ලාභයෙහි සියයට 40 ක අඩු වීමක් ද සමඟ 2015 වසරේදි බදු පෙර ලාභය රු. මිලියන 15 ක් විය.<br><br>2016 වසර සඳහා ඉලක්කගත මිලියන 2.5 ක සංචාරක ආගමනයද සමඟ සංචාරක කර්මාන්තයේ අපේක්ෂිත සීඝ්‍ර සංවර්ධනය හේතු කොට ගෙන හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා ඉහළ විභවයක් පවතින අතර දේශීය තෑගි හා සැමරුම් භාණ්ඩ ක්ෂේත්‍රය සඳහා විශාල වෙළඳ පොළ අවස්ථා බිහි වෙමින් පවතී. | ප්‍රසාරණය වෙමින් පවතින සංචාරක ක්ෂේත්‍රයේ උපරිම ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා සංචාරකයින් බහුල ප්‍රදේශ වල අලෙවි කුටි ස්ථාපිත කිරීම සඳහා උපායමාර්ග යෙදිය යුතුය.<br><br>ආයතනයේ වෙළඳපොළ කොටස් ප්‍රමාණය වැඩි කර ගැනීමට හා ආයතනයේ තිරසාරත්වය රැකෙන පරිදි සුදුසු උපාය මාර්ගික සැලැස්මක් නිර්මාණය කළ යුතුය.<br><br>ගොඩනැගිලි කුලී අවම කර ගැනීම සඳහා ආයතනය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | |
| සීමාසහිත ලංකා සතොස | ලංකා සතොස ආයතනය මෙම වසරේදී නව වෙළඳ සැල් 06 ක් විවෘත කල ද මුළු විකුණුම් ආදායම සියයට 5 කින් අඩු වී ඇත. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ සතොස ආයතනයේ කාරක ප්‍රාග්ධනයේ හිඟතාවයයි.<br><br>ලංකා සතොස ආයතනය 2014 වසරේදී එවකට දේශීය වෙළඳපොලේ පැවති සහල් හිඟය අවම කිරීම සඳහා සහල් ආනයනය කිරීම පිණිස රු. බිලියන 14 ක් වන බැංකු ණය ප්‍රමාණයෙන් රුපියල් බිලියන 8.7 ක් 2015 වර්ෂය අවසන් වන විටත් නොගෙවා හිඟව පවතී. | මෙම අරමුණු සාක්ෂාත් කර ගනිමින් ආයතනය යලිත් වරක් ලාභදායී ආයතනයක් බවට පත් කිරීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට සතොස ආයතනය ක්‍රියා කල යුතුය. එසේම ඒකාබද්ධ පාලනයක් තුලින් විශේෂයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ඇති දුර්වලතා මග හරවා ප්‍රතිසාධනය කර ගැනීමට කටයුතු කළ යුතුව ඇත. | |
| ලංකා රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව | පසුගිය වසර හා සංසන්දනය කරන විට 2015/16 මූල්‍ය වසරේදී මුළු ආදායම සියයට 25 කින් අනුක්‍රමිකව අඩුවී ඇත. මෙම ආදායම අඩුවීමට ප්‍රධාන හේතුව වන්නේ රාජ්‍ය අංශයේ තොරතුරු තාක්ෂණික ව්‍යාපෘති සහ අභ්‍යන්තර නිර්මාණකරණ පිළිබඳ ව්‍යාපෘතීන් කල් දැමීමය.<br><br>කෙටිකාලීන මූල්‍යාන පහසුකම්හි උපකාර රහිතව රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාවට එහි මෙහෙයුම් මූල්‍ය ප්‍රවාහය පාලනය කරගැනීමට අපොහොසත් වී ඇත. 2015/2016 වර්ෂයන්හිදී පිළිවෙලින් මූල්‍ය පිරිවැය සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වී ඇත. | වෙළඳපල අවස්ථාවන් අනුව ඉදිරිපත්කළ හැකි නිෂ්පාදනයන් හඳුනාගැනීම සහ එහි නිෂ්පාදන වල වෙළඳ නාමයන් වර්ධනය කිරීම සඳහා සුදුසු උපායමාර්ගයන් හඳුනාගැනීම තුලින් රාජ්‍ය අංශයේ වෙළඳපල ව්‍යාපාරික අවධානම අඩු කල හැකි පරිදි හා පෞද්ගලික අංශය අභිබවා යන ආකාරයට ආයතනයේ පොදු නිෂ්පාදන සඳහා නව උපාය මාර්ගයන් යොදවා ගැනීම | |

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග | නිර්දේශයන් | නිර්දේ |
|---|---|---|---|
| රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ ආදායම සියයට 2.5 කින් පහල වැටී ඇති අතර එයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ පෙළ පොත් මුද්‍රණය පහත වැටීමයි. මීට අමතර වශයෙන් රජයේ වැටුප් වැඩි කිරීම හේතුවෙන් මුළු වියදම සියයට 4 කින් වැඩිවී ඇත. ඒ අනුව 2014 දී මිලියන 71 ක් වූ බදු පෙර ලාභය 2015 දී රුපියල් මිලියන 3 දක්වා පහත වැටී ඇත. 2015 වසරේදී රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව වර්ෂයේ මාස 4.5 ක් පමණ කාලයක් සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය තොගයක් පවත්වාගෙන ඇති අතර (තොග පිරිවැටුම් කාලය) මේ සඳහා රුපියල් මිලියන 200 ක පමණ මුදල් ආයෝජනයක් කර තිබේ. මීට අමතර වශයෙන් ණය ගැතියන්ගෙන් මුදල් එකතු කිරීමට මාස 06 ක පමණ කාලයක් (ණය අය කිරීමට ගත් කාලය) ගත වන අතර මේ සඳහා රුපියල් මිලියන 673 ක් හිර කර ඇති අතර මේ අනුව කාරක ප්‍රාග්ධනයෙහි ආයෝජනය කර ඇති මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 873 ක් වේ. | සංස්ථාවේ මූල්‍ය පිරිවැය අඩුකර ගැනීමට සහ එහි ලාභදායිත්වය වර්ධනය කිරීම සඳහා ආයතනයේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය දියුණු කල යුතුය.<br><br>මධ්‍යකාලීනව ආයතනයෙහි ලාභදායිත්වය වැඩිකිරීම සඳහා ආයතනයේ ධාරිතා භාවිතය උපරිමකරණය කළ යුතු අතර එමෙන්ම කාර්යක්ෂම පිරිවැය ක්‍රමෝපායන් භාවිතාකර වෙළඳපල කොටස වැඩිකල යුතුය. | |
| රාජ්‍ය දැව සංස්ථාව | දැව සංස්ථාව විසින් 2014 වසරේ රු.මිලියන 3,473 ක්ව පැවති ආදායම 2015 වසර වන විට රු. මිලියන 3,836 ක් දක්වා සියයට 10 කින් වර්ධනය කොට ගෙන ඇත.<br>රාජ්‍ය දැව සංස්ථාව 2014 වසරට සාපේක්ෂව 2015 වසරේදී ලාභය රු.මිලියන 390 ක් දක්වා, එනම් සියයට 90 කින් වර්ධනය කර ගනිමින් ලාභදායීත්වය තවදුරටත් පවත්වාගෙන යාමට සමත්ව ඇත.<br><br>සංස්ථාව විසින් 2015 වසරේදී රු.මිලියන 50 ක මුදලක් අයබදු වශයෙන් මහා භාණ්ඩාගාරය වෙත ගෙවා ඇත. | වඩා විශාල ලාභාන්තිකයක් ලබාදෙන සහ විශේෂිත වෙළෙඳපොළ ඉල්ලුම් සපුරාලන පරිසර හිතකාමී නිෂ්පාදන කෙරේ අවධානය යොමු කරමින් කර්මාන්තයේ ස්වශක්තතාවය තහවුරු කරගත හැකිවන පරිදි නිසි ක්‍රියාමාර්ග ගත යුතුය.<br><br>දැව භාණ්ඩ නිෂ්පාදනය සඳහා උපායමාර්ගික හවුල්කාරීත්වයක් ඇතිකර ගැනීම. | |
| **රක්ෂණ අංශය**<br><br>ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | පෙර වර්ෂයේ රු. මිලියන 29,301 ට සාපේක්ෂව මෙම වර්ෂයේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රු. මිලියන 29,818 ක මුළු ආදායමක් වාර්තා කර ඇත. මෙම වර්ෂයේ දළ ලිඛිත වාරික රු. මිලියන 24,411 ක් වන අතර එය පෙර වර්ෂයේ රු. | රටෙහි රක්ෂණය විනිවිද යාමේ ප්‍රමාණය ඉතා අඩු මට්ටමක පැවතියත්, කර්මාන්තය ව්‍යාප්ත කිරීමට විශාල අවස්ථාවක් පැවතීමත් නිසා ප්‍රවේශ නොවූ වෙළඳපළවල් වෙත ප්‍රවේශ වීම සඳහා නව ව්‍යාපාර සංවර්ධන උපායමාර්ග | |

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග | නිර්දේශයන් | නිර්දේ |
|---|---|---|---|
| | මිලියන 20,665 ට සාපේක්ෂව සියයට 18ක වර්ධනයකි. | ක්‍රියාත්මක කල යුතුය. | |
| ජාතික රක්ෂණ භාර අරමුදල | 2014 වර්ෂයේ පැවති රු. බිලියන 5.84 ක් වූ දළ ලිඛිත වාරික ආදායමට සාපේක්ෂව මෙම වර්ෂයේ දළ ලිඛිත වාරික රු. බිලියන 5.09 දක්වා සියයට 12.9 කින් අඩු වී ඇත.<br>මුළු හිමිකම් සියයට එකක් වැනි සුළු ප්‍රතිශතයකින් රු. බිලියන 3.24 දක්වා පෙර වර්ෂයේ පැවති රු. බිලියන 3.2 ට සාපේක්ෂව වර්ධනය වී ඇත.<br>ජාතික රක්ෂණ භාර අරමුදල රු. බිලියන 3 ක් අයභාර ලෙස ඒකාබද්ධ අරමුදලට බැර කර ඇත. | විවිධාංගීකරණය වූ හා නම්‍යශීලී කරහකාරී නිෂ්පාදන ඉදිරිපත් කරමින් වඩා හොඳ ප්‍රතිරක්ෂණ පරිසරයක් ආයතනය තුළ ඇති කළ යුතුය. | |
| **පශු සම්පත් අංශය**<br>මිල්කෝ ආයතනය | 2016 අයවැය මඟින් දේශීය කිරිපිටි වල මිල ගණන් අඩු කළ අතර ඒ හේතුවෙන් මිල්කෝ ආයතනයට දැරීමට සිදුවන පාඩුව භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූර්ණය කරනු ලබයි.<br>මිල්කෝ ආයතනය වෙත එහි ලාභය ඉහළ නංවා ගැනීම උදෙසා තරහකාරී ලෙස තම නිෂ්පාදන වල මිල ගණන් සංශෝධනය කිරීමට පහසුකම් සලසා දෙන ලදි.<br>භාණ්ඩාගාරය විසින් යුරෝ මිලියන 33.8 ක සහ යුරෝ මිලියන 64 ක් වශයෙන් ණය මුදල් දෙකක් ලබා ගැනීම සඳහා මිල්කෝ සමාගම වෙත පහසුකම් සලස්වා දෙන ලදී. එම ණය මුදල් දෙකෙන් යුරෝ මිලියන 33.8 ක ණය මුදල අඹේවෙල, දිගන හා පොළොන්නරුව යන කර්මාන්තශාලා තුන නවීකරණය කිරීම සඳහා ලබා දී ඇති අතර ඉන් දිගන හා පොළොන්නරුව කර්මාන්තශාලා දෙකේ කටයුතු දැනටමත් සම්පූර්ණ කර ඇත. අඹේවෙල කර්මාන්තශාලාවේ නවීකරණ කටයුතු ජුනි මස අවසානය වන විට සම්පූර්ණ කිරීමට යෝජිතය.<br>දෙවන ණය මුදල (යුරෝ මිලියන 64) නාරාහේන්පිට පිහිටි කිරි කර්මාන්තශාලාව, නැවත බඩල්ගම පිහිටුවීම සඳහා ලබාගෙන ඇති | දියර කිරි සඳහා වන මෙතෙක් අත්පත් කර නොගත් ඉල්ලුමෙන් ප්‍රයෝජන ගැනීම සඳහා වෙළඳපොළ නියෝජිතයන් ධෛර්යමත් කිරීම හා දියර කිරි භාවිතය ප්‍රවර්ධනය කිරීම.<br>කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන වෙළඳපොළ විධිමත් කිරීම හා සාම්ප්‍රදායික හා අවිධිමත් වෙළඳපොළ හඳුනා ගැනීම සහ සුදුසු හා කාර්යක්ෂම වෙළඳපොළ යාන්ත්‍රණයක් හඳුන්වා දීම. | |

| අංශය | රාජ්‍ය ව්‍යවසායයන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග | නිර්දේශයන් | නිර්දේ |
|---|---|---|---|
| | අතර එහි වැඩ කටයුතු 2016 මැයි මස තුළ ආරම්භ කොට ඇත. | | |
| ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ඉහළ ඵලදායිතාවයෙන් යුත් තවත් කිරි දෙනුන් 2500 ක් ආනයනය කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 20 ක ණය මුදලක් ලබා ගැනීමට පහසුකම් සළසා දුන් අතර එම දෙනුන් ආනයනය කොට රිදියගම ගොවිපළේ ස්ථාපනය කොට ඇත. ඒ සමගම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කිරි නිෂ්පාදනය ද ඉහළ ගොස් ඇත. | ආනයනය කරන ලද ඉහළ ඵලදායිතාවයෙන් යුත් කිරි දෙනුන්ගෙන් ලබාගත් පැටවුන් යොදා ගනිමින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් නව කිරි අලෙවිසැල් ඇති කිරීම. | |
